# මගේ කාලය හා අනෙකාගේ කාලය

නිරීක්ෂකයකුගේ රාමුවෙහි තමා නිසලව සිටිය ද අනෙක් අංශුවල හා වස්තුවල පිහිටීම වෙනස්වන බව අපි දුටුවෙමු. ඒ හේතුවෙන් නිරීක්ෂකයාගේ රාමුවෙහි තමාගේ අවකාශ ඛණ්ඩාංක වෙනස් නොවුණ ද (ඒ ඛණ්ඩාංක ශූන්‍යවන පරිදි අවශ්‍ය නම් ඛණ්ඩාක්ෂ තෝරාගත හැකි ය.) කාල ඛණ්ඩාංකය වෙනස් වෙයි. අපට ප්‍රශ්නයක් වී තිබුණේ වෙනත් අංශු හා වස්තු නිරීක්ෂණයකිරීමට නොහැකි, ඒ සමග සංනිවේදනයකිරීමට නොහැකි නිරීක්ෂකයකු ගතහොත් එවිට ඔහුගේ කාල ඛණ්ඩාංකය ගැන කිවහැක්කේ කුමක් ද යන්න ය.

නිරීක්ෂකයා අංශුවක් නොවන කල හා මතකයක් ඇති අයකුවන කල මේ ප්‍රශ්නයට පිළිතුරුදීම අපහසු කාර්යයක් නො වෙයි. එයට හේතුව වෙනත් අංශු හා වස්තු නොමැති වුව ද නිරීක්ෂකයාගේ ශරීරයෙහි වෙනස්කම් සිදුවීම ය. එහෙත් ඒ වෙනස්කම් ඇතිවීම පිළිබඳ ඔහුට මතකයක් තිබිය යුතු ය. නිරීක්ෂකයාට මතකයක් නැත්නම් වෙනසක් වී ඇති බව නො දැනෙයි. හම රැළිවැටීම, ශරීර වේදනා ආදී වශයෙන්  තමාගේ ශරීරයේ වෙනස්කම් සිදුවන බව දැනෙන්නේ මතකයක් ඇති බැවින් ය. මතකයක් නැත්නම් වෙනසක් සිදු වී ඇති බව දන්නේ කෙසේ ද?  හම රැළිවැටීම ගැන දන්නේ හම රැළි නොවැටී තිබූ බව මතක ඇති බැවින් ය. වේදනාව, වේදනාවක් ලෙස දැනෙන්නේ වේදනාවක් නොමැතිව තිබූ බවට මතකයක් ඇති බැවින් ය.

කෙටියෙන් කියන්නේ නම් වෙනස්වීම එලෙස වෙනස්වීමක් ලෙස දැනෙන්නේ මතකයක් ඇති බැවින් ය. වෙනස්වීමක් නැත්නම් හෝ මතකයක් නැත්නම් හෝ කාලයක් යනුවෙන් සංකල්පයක් නිර්මානයකිරීමට අවශ්‍ය නො වෙයි. වෙනසක් වී ඇති බව දැනගන්නේ වෙනසක් නැති නිත්‍ය තත්ත්වයක් උපකල්පනය කෙරෙන බැවින් ය. අපි පළමුකොටම ශරීරය යනුවෙන් වෙනස් නොවන නිත්‍ය තත්ත්වයක් ඇතැයි සලකමු. එහෙත් හම රැළිවැටීම ආදී වශයෙන් සැලකුවිට ඒ එසේ නොවන බව දැනගත්විට හා මතකය ඇතිවිට වෙනස්වීම යන සංකල්පය නිර්මානයකරන්නෙමු.

මෙහි දී අප විසින් අමතක කරනු ලැබූ කරුණක් ද වෙයි. එනම් මතකය නිසා ඇතිවන තත්ත්වය ය. මතකය හේතුකොටගෙන ආත්මය යන සංකල්පය ඇතිවෙයි. මම යන සංකල්පය ඇතිවන්නේ මතකය හේතුකොටගෙන ය. මම යන්න ස්මරණය සමග බැඳී ඇත. ස්මරණය තොරතුරු ගබඩාකිරීම, එක්රැස්කිරීම සමග බැඳෙයි. මෙය මනසෙහි ලක්ෂණයක් වෙයි. ඇති වී නැතිවන චිත්ත ප්‍රවාහයක් මනස ලෙස සැලකෙයි. මේ චිත්ත ප්‍රවාහය ඇති වී නැතිවන්නේ එක් චිත්තයක තොරතුරු රාශියක් අනුයාත චිත්තයට හිමිකරමින් ය. එලෙස අනුයාත චිත්තවලට උරුමකරන තොරතුරු මනස යන සංකල්පය බිහිකිරීමට හේතුකාරක වෙයි. චිත්ත, තොරතුරු, මනස හා මතකය එකිනෙකට බැඳී ඇත්තේ ඒ අයුරින් ය.

අනෙක් සියළු වස්තුවලින් හා අංශුවලින් සම්පුර්ණයෙන් ම වෙන්කරනු ලැබූ නිරීක්ෂකයකුට ද එසේ මනස, ආත්මය,. මම යන සංකල්ප ඇතිවෙයි. ඒ සඳහා දරුවකු මව්කුසින් බිහිවීම අවශ්‍ය නො වෙයි.  මව්කුසෙහි දී ද කළල රූපය යම් ප්‍රමාණයකට වැඩී ප්‍රාණියකු කලලයට වැදීමත් සමග, එනම් ප්‍රතිසන්ධි චිත්තය ඇතිවීමත් සමග මම යන සංකල්පය වෙයි. එයට හේතුව ප්‍රතිසන්ධි චිත්තය යන්න කලින් භවයක චුති චිත්තයට පසුව ඇතිවීමත්, චුති චිත්තයෙහි තොරතුරු රාශියක් ප්‍රතිසන්ධි චිත්තයට උරුමකිරීමත් හේතුවෙන් ය. මනස යන්න මේ භවයට පමණක් සීමා වී යැයි නොසිතිය යුතු ය. සංසාර ගමනේ දී එක් රැස්කරගත් තොරතුරු චුති ප්‍රතිසන්ධි චිත්ත ඔස්සේ මනස විසින් උරුමකරගනු ලැබෙයි. මෙයින් පැහැදිලිවන කරුණ නම් අනිත්‍ය හා අනාත්ම අනවබෝධය කාලය යන සංකල්පය නිර්මානයකිරීම පිටුපස ද ඇති බව ය.

මෙහි දී කිවයුතු කරුණක් වෙයි. ඊනියා පශ්චාත්නූතනවාදය යන නමින් හැඳින්වෙන බටහිර මතවාදවලට අනුව මම පිළිබඳ හැඟීම, මමත්වය, මමායනය ආදියෙන් හැඳින්වෙන්න ඇතිවන්නේ දර්පන තලයකින් හෙවත් කණ්නාඩියකින් මුහුණ බැලීමෙන් පසුව ය. දර්පනයකින් පළමු වරට මුහුණ බලන දරුවාට වෙනත් අයකු විසින් එහි පිළිබිඹු වන්නේ ඒ දරුවාය යැයි  කියා දෙනු ලැබෙයි. පශ්චාත්නූතනවාදී යැයි කියන මතවාදවලට අනුව දරුවාට තමා පිළිබඳ හැඟීමක් ලැබෙන්නේ ඉන්පසුව ය.  ඉන් පෙර දරුවාට තමා පිළිබඳ හැඟීමක්, මම යන අදහසක්, මමායනයක් ඇති නො වෙයි.

© Prof. Nalin De Silva

මහා පණ්ඩිතයන්, මනෝ විශ්ලේෂකයන් මෙන් බටහිර පෙනී සිටින්නන් විසින් ඉදිරිපත්කෙරෙන මතවාදවල ඇති බංකොලොත් බව මෙයින් තහවුරු වෙයි. මේ මතවාදයට අනුව දරුවකු දර්පන තලයකින් මුහුණ බැලීමට පෙර ඔහුට තමා පිළිබඳ හැඟීමක් නැත. දර්පන තලයකින් එසේ මුහුන බැලීමෙන් පසුව ද තමා පිළිබඳ හැඟීමක් ලැබෙනුයේ අන් අයකු විසින් එහි පිළිබිඹුවන්නේ තමා යැයි කියා දීමෙන් පසුව පමණ ය. වෙනත් අයකු එසේ පැහැදිලි නොකළහොත් දරුවාට තමා පිළිබඳ හැඟීමක් ඇති නො වෙයි. මෙහි දී අඩුම තරමින් ප්‍රශ්න දෙකක් පැනනගියි. දර්පන තල පිළිබඳ දැනුමක් ඇතිවීමට පෙර මිනිසුන්ට තමා ගැන හැඟීමක්, මම යනුවෙන් සංකල්පයක් නො තිබුණි ද? එයට පිළිතුරක් ලෙස ඇතැමකු කියනු ඇත්තේ ඇළක දොළක හෝ වෙනත් දියපහරක පිළිබිඹුවන රූප මිනිසුන් දැක ඇති බැවින් ඒ අනුසාරයෙන් මිනිසුන්ට තමන් ගැන හැඟීමක් ඇතිවීමට ඉඩ තිබුණු බව ය. එහෙත් ඒ සමග මතුවන දෙවන ප්‍රශ්නයක් ද වෙයි. දර්පන තලයක හෝ වේවා ජලයෙහි හෝ වේවා පළමු වරට තම ඡායාව දකින තැනැත්තා තමා පිළිබඳ හැඟීමක් ඇතිකර ගන්නේ කෙසේ ද? ඔහුට ඒ ඡායාව තමාගේ යැයි කියා දීමට වෙනත් අයකු නැත.

මෙහි දී මේ ගැටළුවෙන් ගොඩ ආ හැකි මඟක් ද ඇති බව කිවයුතු ය. දෙදෙනකු සිටින අවස්ථාවක ඒ දෙදෙනාගේ ඡායා ජලයෙහි පිළිබිඹු වන්නේ නම් එක් ඡායාවක් අනෙකාගේ බව කියා දීමට එක් අයකුට හැකිවෙයි. එවිට දෙවැන්නා ද පළමුවැන්නාට කියනු ඇත්තේ පළමුවැන්නාගේ ඡායාව ද ජලයෙහි පිළිබිඹු වන බව ය. මෙයින් කියැවෙන්නේ එලෙස ඡායා මගින් පළමුවරට තමන් යැයි හැඟීමක් ඇතිකරගැනීමට අඩුම තරමින් දෙදෙනකුවත් සිටිය යුතු බව ය. එහෙත් මේ තේරුම්කිරීම පවා එතරම් සරල නැත. එයට හේතුව තමා යන හැඟීම නැත්තකු අනෙකාගේ යැයි හැමීමක් ඇතිකරගන්නේ කෙසේ දැයි මෙයින් පැහැදිලි නො වීම ය.

ජලයෙහි ඡායා දෙකක් එකවිට දකින දෙදෙනකුගෙන් එක් අයකු (A යැයි සිතමු) ඉන් එක් ඡායාවක් අනෙකාගේ (B ගේ යැයි සිතමු.) යැයි හඳුනාගන්නේ කෙසේ ද? ජලයෙහි එසේ ඡායා දෙකක් දකින තැනැත්තකුට ඇතිවන හැඟීම එහි තුන් දෙනකු සිටින බව ය. ඒ තමා ගැන හැඟීමක් නැතැයි සලකමින් ය. A ට අනුව එක් අයකු ගොඩ ද දෙදෙනකු දියෙහි ද වෙයි. දියෙහි සිටින දෙදෙනා සමග කතාකිරීමට නොහැකි වුව ද ඒ දෙදෙනා ස්පර්ශකිරීමට නොහැකි වුව ද, ඒ දෙදෙනා ස්පර්ශකිරීමට යැමේ දී දෙදෙනා චුතවන බව තම අත්දැකීම වුව ද දියෙහි දෙදෙනකු ඇති බව ඔහු දැනගනියි. ඔහු සිතනු ඇත්තේ දියෙහි සිටින දෙදෙනා ස්පර්ශකිරීමට යැමේ දී චුතවන, කතානොකරන අරුම පුදුම පුද්ගලයන් දෙදෙනකු කියා ය.

දියෙහි සිටින දෙදෙනාගෙන් එක් අයකු ගොඩ සිටින පුද්ගලයාගේ ඡායාව යැයි ඔහු නිගමනයකරන්නේ කෙසේ ද? තමා ගැන හැඟීමක් නැති ඔහුට B ගැන සිතිය හැකි වුව ද, ඒ යම් පුද්ගලයකු යැයි සිතිය හැකි වුව ද, දියෙහි ඇත්තේ B ගේ ඡායාව යැයි ඔහු නිගමනයකරන්නේ කෙසේ ද? A ට B ගේ යන සංකල්පය ඇතිවන්නේ කෙසේ ද? දියෙහි ඇත්තේ B ට සමාන රුවක් ඇති පුද්ගලයකු යැයි නිගමනයකිරීමට A ට හැකි වුව ද දියෙහි ඇත්තේ B ගේ රූපය හෝ ඡායාව හෝ ප්‍රතිබිම්බය යැයි ඔහු තීරණයකරන්නේ කෙසේ ද? A ට B ගේ යන සංකල්පය ඇතිවන්නේ කෙසේ ද? අප අද සරල යැයි සිතුව ද පුද්ගලයකුගේ හෙවත් පුද්ගලයකුට අයිතිය යන සංකල්පය ඇතිකර ගැනීම පහසු නො වෙයි. මගේ යන සංකල්පය නොමැතිව අසවලාගේ යන සංකල්පය ඇතිකරගන්නේ කෙසේ ද?

බටහිරයන් මම යන සංකල්පය ඇතිවන්නේ කෙසේ දැයි තේරුම්කිරීමේ දී පඹගාලක පැටලෙන්නේ කෙසේ දැයි මෙයින් පැහැදිලි වෙයි. බටහිර පශ්චාත්නූතනවාදීන් ගෙනෙන මේ විකාර මත මෙරට සිටින ඔවුන්ගේ පුහු අනුකාරකයෝ ඉවක් බවක් නැතිව අනුකරණයකරති. මේ පුස්සන් සිතන්නේ බටහිර දැනුම මහත් වර්ධනය වූ අවස්ථාවක ඇතැයි යන්න ය. එහෙත් එය එසේ නො වෙයි. ස්වාභාවික විද්‍යා යැයි බටහිරයන් අතින් හැඳින්වෙන විද්‍යාවන්හි යම් වර්ධනයක් දැකිය හැකි වුව ද, බටහිර සමාජයීය විද්‍යාවන් සම්බන්ධයෙන් එසේ කිවහැකි නො වෙයි. බටහිර භෞතික විද්‍යාව පසුපස නොන්ඩි ගසන බටහිර සමාජයීය විද්‍යා පසුවන්නේ ඉතාමත් අසරණ තත්ත්වයක ය.

බටහිර පශ්චාත්නූතනත්වය යනුවෙන් අළුත් තත්ත්වයක් නැත. එහි ක්‍රිස්තියානි නූතනත්වය වර්ධනය වීම හැරෙන්නට වෙනත් දෙයක් පසුගිය අවුරුදු පන්සියක පමණ කාලයක සිදු වී නොමැත. ඊනියා පශ්චාත්නූතනවාදීන් මම පිළිබඳ සංකල්පය තේරුම් ගැනීමට යන්නේ අනෙකා මාර්ගයෙන් ය. දරුවකුට තමා යන සංකල්පය දර්පන තලයක් හරහා

© Prof. Nalin De Silva

අනෙකකු විසින් ලබාදිය යුතු වෙයි. ඉන් ඔබ්බට ගොස් මේ කසිකබල් උගතුන් කියා සිටින්නේ මම යන්න තීරණය කෙරෙන්නේ අනෙකා විසින් බව ය. එහෙත් අපට මෙහිදී අසන්නට ඇත්තේ ඉතා සරල ප්‍රශ්නයකි. අනෙකා යන සංකල්පය ඇතිවන්නේ කාට ද? අනෙකා යනුවෙන් සංකල්පයක් ඇතිවිය යුත්තේ මනසක ය. ඒ මනස කාගේ ද? අනෙකාගේ ද? නැත්නම් තමාගේ ද? එසේත් නැත්නම් නොපෙනෙන දෙවියන් වහන්සේ කෙනකුගේ ද? බටහිර තම ස්වාමීන්ගෙන් මෙවැනි ප්‍රශ්න ඇසීමට මෙරට සිටින අනුකාරක පුස්සන්ට නො හැකි ය.

කෙසේ වෙතත් මේ අනෙකා පිළිබඳ සංකල්පය ඇතිවන්නේ ම දෙවියන් වහන්සේ නිසා ය. බටහිර මතවාද කැරකැවෙන්නේ දෙවියන් වහන්සේ වටා ය. සියල්ල තීරණය කරන්නේ මේ කාගේත් අනෙකා වූ දෙවියන් වහන්සේ ය. අප නො වේ. මම යන්න ද තීරණය කරන්නේ අනෙකා යැයි කියන්නේ ඒ සියල්ල පසුපස ඇතැයි බටහිරයන් අවසාන විග්‍රහයේ දී සලකන ප්‍රධාන අනෙකා වූ දෙවියන් වහන්සේ මුල්කරගනිමින් ය. සියල්ල සිදුවන්නේ උන්වහන්සේගේ කැමැත්ත පරිදි ය. එහෙත් අප මම පිළිබඳ සංකල්පය ගොඩනගන්නේ වෙනත් කිසිවකු අනෙකකු හෝ අවසානයේ දී දෙවියන් වහන්සේ කෙනකු මත පදනම් වී නො වෙයි. මනස මනසේම නිර්මානයක් වෙයි. තමන්ට තමන් සරණ හැර වෙනත් සරණක් නැත. සිංහල බෞද්ධ සංස්කෘතියෙහි මනස පිළිබඳ සංකල්ප ගොඩනැගෙන්නේ ද මනස ඇසුරෙන් ය. ඒ මනස විසින් කාලය යන සංකල්පය නිර්මානය කෙරෙයි. කාලය යනු අපේ නිර්මානයක් මිස අපෙන් තොරව අප සිටියත් නැතත් අනෙකකුගේ, එනම් දෙවියන් වහන්සේගේ මනසෙහි ගලායන ඊනියා නිරපේක්ෂවූවක් නො වෙයි.

**මහාචාර්ය නලින් ද සිල්වා**

© Prof. Nalin De Silva